# ලිංගික හිංසනයට එරෙහි ප්‍රතිවිරෝධී චර්යා ඉගැන්වීමට භූමිකා රංගය භාවිතයට ගැනීම පිළිබඳ ගවේෂණාත්මක අධ්‍යයනයක්.

*ඒ.එම්.ඩී.එස්. අලහකෝන්* [1]

ඵලදායී ඉගෙනුමක් සඳහා නිරීක්ෂණය කර ගබඩා කර ගත් දැනුම සංකේතාත්මක චර්යාවක් බවට පරිවර්තනය කරමින් එම චර්යාව නැවත නැවත පුහුණු කල යුතුය. භූමිකා රංගය හරහා අදාළ දැනුම නාට්‍යමය යථාර්ථයක් තුළ අත්දැකීමට, අත්හදා බැලීමට හා පුහුණු කිරීමට අවකාශය සැලසේ. එමගින් පුද්ගල චිත්තවේග ප්‍රකාශ කිරීමට සහ නිවැරදි ප්‍රතිචාර සන්නිවේදනය කිරීමට ලැබෙන පුහුණුව හරහා පුද්ගල සංජානනය මෙන් ම චර්යාවද වෙනස් කළ හැකිය. ලිංගික හිංසනයට ලක් වීම තුළ දරුවන්ගේ මානසික යහ පැවැත්ම බිඳ වැටෙමින් අධ්‍යාපනික දුර්වලතාවයන්, චිත්තවේගී ගැටලු, සමාජ භීතිකාවන්, අන්තර් පුද්ගල සබඳතා තුළ ගැටලු, සියදිවි නසා ගැනීම්වලට යොමු වීම යනාදී ගැටලු රාශියක් සමාජය තුළ දැකිය හැක. එබැවින් ලිංගික හිංසනයට එරෙහිව දරුවන් සවිබල ගැන්වීම සඳහා ප්‍රතිවිරෝධී චර්යා ඉගැන්වීමට භූමිකා රංගය ඵලදායීද යන්න ගවේශණය කිරීම මෙම පර්යේෂණයේ මූලික අරමුණයි. මේ සඳහා රංග චිකිත්සක පර්යේෂණ ආයතනය තුළ කොළඹ දිස්ත්‍රික්කයේ පාසල්වල ඉගනුම ලබන කණිෂ්ඨ අංශයේ සිසුන් 15 දෙනෙකු නියැදිය ලෙස තෝරා ගත් අතර ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය ඔස්සේ අධ්‍යයනය සිදු කෙරුණි. දත්ත විශ්ලේෂණය සඳහා තේමාත්මක විශ්ලේෂණය තෝරාගත් අතර දත්ත රැස් කිරීම සම්මුඛ සාකච්ඡා සහ සහභාගීත්ව නිරීක්ෂණය හරහා සිදු කෙරුණි. කේතකරණය හරහා පළමුව දත්ත වර්ගීකරණයට ලක් කරන ලද අතර පසුව එම වර්ගීකරණයන්ට අදාළ තේමා හඳුනාගන්නා ලදී. හඳුනාගත් ප්‍රධාන තේමා ලෙස ගවේෂණය, නිර්මාණශීලීත්වය, පුහුණුව සහ අභිප්‍රේරණය දැක්විය හැකිය. ගවේෂණය යටතේ ලිංගික හිංසනය තමන්ට බලපාන ආකාරය, ප්‍රතිවිරෝධි චර්යා ඉගෙනුම, කණ්ඩායම් අත්දැකීම් තුළින් ලද දැනුවත් බව දැක්විය හැකිය. නිර්මාණශීලීත්වය යටතේ ගැටලු විසදාගන්නා නව ක්‍රම සෙවීම, විවිධ සංජානනයන්ගෙන් ලබන නව අවබෝධයන්ට විවෘත වීම, විචාරශීලි සිතීම දියුණු වීම යනාදිය දැක්විය හැකිය. පුහුණුව යටතේ මුහුණේ ඉරියව් සහ ශරීර භාෂාව ඉගෙනුම, සිදුවීම් තුළදි සිහිය පවත්වා ගැනීමට පුහුණුව, චිත්තවේගී සමබරතාව පවත්වා ගැනීමට ලද පුහුණුව, කණ්ඩායම් ඉගෙනුම තුළ ලද දැනුම ප්‍රායෝගිකව අත් හදා බැලීමත් සහ අභිප්‍රේරණය යටතේ නිවැරැදි ප්‍රතිචාර දැක්වීමට පුහුණුවීම තුළින් ආත්ම විශ්වාසය ගොඩ නැගීම, ප්‍රතිවිරෝධි චර්යා ඉගෙනුම තුළින් අභිප්‍රේරණය වීම, සමාජ සහයෝගිතාව පිළිබඳ ඇති දැනුවත්බව වැඩි වීම යනාදිය දැක්විය හැකිය. භූමිකා රංගය හරහා දරුවන්ට යථාර්ථය මගහැරීම වෙනුවට යථාර්ථයට මුහුණ දීමට සහ ඒ සමග ගනුදෙනු කිරීමට අවකාශය සහ පුහුණුව ලබා දේ. එමගින් පුද්ගල දැනුම, ආකල්ප සහ හැසිරීම් වෙනස් කර ගැනීමටත් නව ශක්‍යතාවයන්ගෙන් පෝෂණය වීමටත් නාට්‍යමය යථාර්ථයක් තුළ ලද ඉගෙනුම ශරීරගත අත්දැකීමක් බවට පත්කර ගැනීමටත් හැකි වේ. එබැවින් හුදු සංකල්ප ඉගෙනුමකට වඩා දැනුම අත්දැකීමක් බවට පරිවර්තනය කරනු ලබන ඉගෙනුමක් සඳහා භූමිකා රංගය වඩාත් උචිත වූත් යෝග්‍ය වූත් ක්‍රමෝපායකි.

***ප්‍රමුඛ පද:*** ඉගෙනුම, පාසල් ළමුන්, ප්‍රතිවිරෝධී චර්යා, භූමිකා රංගය, ලිංගික හිංසනය

[1] මානවශාස්ත්‍ර අධ්‍යනාංශය, සමාජීයවිද්‍යා සහ මානවශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය. alahakoonsaumya@gmail.com